
# අම්මම්මා



කෞමිණී උපේක්ෂා කුමාරිහාමි

# අම්මම්මා

කතෘ

කෞමිණී උපේක්ෂා කුමාරිහාමි

මහ/මහමායා බාලිකා විදුහල

5 ශ්‍රේණිය

කතෘගේ වෙනත් කෘති

සුරංගනා ලොවෙන් ආ සුරංගනාවි

කෘතිය පළ කල දිනය

2025-02-08

ISBN No - 978-624-208-410-7

# පිදුම

මේ ලියන අකුරක් පාසා මා හට මතක් වෙන්නෙ ඔබතුමියයි .

ඔබතුමිය දන්නා සියලු දේ කියා දුන්නාට ඔබතුමියට ස්තුති කිරීමට මම මෙය අවස්ථාවක් කරගනිමි .

ආදරණීය හඳා අතාවුද ගුරුමෑණියනි ඔබතුමියට මේ කෘතිය සතුටින් පිරිණමමි .

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


# පටුන

- අම්මම්මා හඳුන්වාදීම .
- මුදල් ඉතිරි කිරීම.
- එළවළු මිල ඉහළ යාම.
- අලුත් ශබ්දකෝෂයක්.
- නිවහනේ සතුට.



# <u>අම්මම්මා හඳුන්වාදීම.</u>

අපේ පවුලෙ හිටියා හරිම හොඳ වැදගත් ලස්සන අත්තම්මා කෙනෙක්. එයාට මම කියන්නෙ අම්මම්මා කියලා. අම්මම්මා මට ගොඩක් ආදරෙයි. මමත් අම්මම්මට ගොඩක් ආදරෙයි. අම්මම්මා අපට එන හැම ප්‍රශ්නයකටම උත්තර දුන්නා.



අම්මම්මට වයස අවුරුදු 87යි. ඒත් අම්මම්මා ගොඩක් වේගයෙන්, පිළිවෙලට, ලස්සනට වැඩ කරනවා. අම්මම්මා කියනවා එයා තාම තරුණයි කියලා. ඒ කතාවට ගෙදර හැමෝම හොඳටම හිනා වුණා. අපේ පවුලෙ අය හැම වෙලාවෙම සතුටින් සමගියෙන් වැඩ කරා.



# <u>මුදල් ඉතිරි කිරීම.</u>

ඔන්න එක දවසක් මගේ ලොකු අක්කිට පාඨමාලාවකට යන්න සල්ලි මදි වුණා. මට ඇහුනා අම්මා කියනවා ඒකට යන්න රුපියල් 112587ක් උවමනයි කියලා. ඒ උනාට අම්මයි තාත්තයි ළග තිබුනේ රුපියල 100000යි. අම්මා මේ ගැන ගොඩක් හිත හිතමයි හිටියේ. ඒක නිසා මගේ ලොකු අක්කි මෙකට යන්නෙ නැතුව ඉන්නයි හැදුවෙ.



ඔන්න මේ ගැන අම්මයි තාත්තයි තවත් දවසක් කතා කර කර හිටියා. අම්මයි තාත්තයි හිතා ගත්තා මේ ගැන අම්මම්මට කියන්න. ඊට පස්සෙ අම්මයි තාත්තයි අම්මම්මට මේ ගැන කිව්වා. අම්මම්මා කෙලින්ම කව්වා ලොකු දූවට එන්න කියලා.



ඊට පස්සෙ අම්මම්මා පෙට්ටගම ඇරලා ලොකු අක්කිට රුපියල් 12587ක් දීලා කිව්වා. මින් පස්සෙ ගෙදර හැමෝම රුපියල රුපියල හරි එකතු කරන්න අපිට මේ වගේ අවස්ථා වලදි ඒ එකතු කරපු මුදල් ප්‍රයෝජනයට ගන්න පුළුවන් කියලා. ඒ වුණු වැඩෙන් ගෙදර හැමෝටම හොඳ පාඩමක් ඉගෙන ගන්න පුළුවන් වුනා.



# එළවළු මිල ඉහළ යාම.

ඔන්න ඉතින් එක කාලෙක එළවළු මිල ඉහළ යන්න පටන් ගත්තා. ඉතින් මේ ප්‍රශ්නය ගැන අම්මයි තාත්තයි හිත හිතමයි හිටියේ. ඉතින් මෙන්න මේ විදියට තමයි එළවළු මිල.

**එළවළු මිල**

| | | |
|---|---|---|
| වට්ටක්කා. | 1kg. | රු.580.00 |
| කැරට්. | 1kg. | රු.489.00 |
| බටු. | 1kg. | රු.380.00 |
| රතු අල. | 1kg. | රු.483.00 |
| පිපිඤ්ඤා. | 1kg. | රු.345.00 |
| මෑ කරල්. | 1kg. | රු.456.00 |
| අල. | 1kg. | රු.567.00 |
| කරවිල. | 1kg. | රු.234.00 |
| ගෝවා | 1kg. | රු.578.00 |


ඔන්න ඉතින් දවසක් උදේම අම්මම්මා ගෙදර ඉන්න හැමෝටම කතා කරා. ඊට පස්සෙ අම්මම්මා හැමෝවම ගෙදර පිටිපස්සෙ තියන කැළෑ රොද මැදින් එළවළු පලතුරු පලා වවපු වත්තකට එක්ක ගියා.



ගෙදර හැමෝම පුදුමෙන් වගේ හිටියේ. ඊට පස්සෙ අම්මම්මා මෙහෙම කිව්වා. හැමෝම හොදට අහගන්න මේ තියෙන්නෙ මගේ එළවළු පලතුරු පලා වත්ත. අර හැමදාම හවසට මම වතුර බේසමක් අරගෙන යන්නේ මේ වත්තට. ඔයාලත් අද ඉඳලාවත් පැල හිටවන්න පුරුදු වෙන්න. අද ඉඳලා ඔයාලට පුළුවන් මේ වත්තෙන් එළවළු පලතුරු පලා කඩාගන්න. හැබැයි මට උදව් කරන්නත් ඕනෙ.



ඔන්න එදා ඉඳලා ගෙදර හැමෝම අම්මම්මට උදව් කරා. ගෙදර පිටිපස්සහ තිබුණු සුද්ද කරලා නැති කැළෑ රොදත් සුද්ද කරලා එතනත් එළවළු පලතුරු පලා ජාති හිටෙව්වා. අම්මම්මා දැන් හරි සතුටින්. ගෙදර අයට මේ නිසා තවත් සල්ලි ලැබෙන ක්‍රමයක් තිබුණා. ඒ තමයි ගෙදරට වැඩි එළවළු කඩේට දීලා සල්ලි ගන්න එක. ඉතින් ඔන්න හැමදාම ගෙදර හැමෝම එකතු වෙලා හවසට වත්තට යන්න පුරුදු වුණා. දැන් ගෙදර හැමෝම සතුටින්.



# <u>අලුත් ශබ්දකෝෂයක්.</u>

ඔන්න එක දවසක් මම පොතක් කියව කියව ඉන්නකොට මට හම්බවුණා අමාරු වචනයක්. ඒ වචනය තමයි අමතර ආදායම” කියන එක. ඉතින් මේ වචනෙ ගැන ගෙදර හැමෝගෙන්ම අහන්න ගියත් ඒ හැමෝම කාර්යබහුලයි.



හැබැයි එක්කෙනෙක් කාර්යබහුල නෑ. ඒ තමයි අම්මම්මා මම ඒ ගැන අම්මම්මට කිව්වා. අම්මම්මා මට ඒ වචනය කියල දුන්නා. ඊට පස්සෙ අම්මම්මා මට පොතක් දීලා කිව්වා දුවේ ඔයාට හම්බවෙන හැම වචනයකම තේරුම ඔය පොතේ ඇති ඔයාට ඔය පොත ගොඩක් උපකාරි වෙයි ඔය පොත හොඳට කියවන්න. ඒ පොතේ උඩින්ම ලියල තිබුනා ශබ්දකෝෂය කියලා..




# <u>නිවහනේ සතුට.</u>


ඔන්න එක දවසක් මම ඉස්කෝලෙ ගිහින් එද්දි අම්මම්මා රෝහලේ නවත්තලා. අම්මම්මට හොඳටම අමාරු වෙලා. මම ගෙදර යනකොට ගෙදර හිටියේ දෝණි අක්කි විතරයි. දෝණි අක්කි මට වෙච්චි මුළු සිද්ධියම කිව්වා. ඊට පස්සෙ මමයි දෝණි අක්කි එකතු වෙලා අම්මම්මට ලෙඩේ ඉක්මණින් සුව වෙන්න කියලා කාඩ්පතක් හැදුවා. අම්මයි තාත්තයි ලොකු අක්කී එද්දි ගොඩක් රෑ වුණා.



අම්මා කිව්වා අම්මම්මව තව මාසෙකින් ගෙදර එක්කන් එන්න පුළුවන් කියලා. මම ගොඩක් දුක් වුණා. මොකද මාසයක් අම්මම්මව බලන්න නැති වෙන එක. ඒ මාසය මම ගෙවා ගතතෙ බොහොම අමාරුවෙන්. පළවෙනි දවසෙ මම අම්මගෙ අතට අර කාඩ්පත දුන්නා. අම්මා ගෙදර ඇවිත් කිව්වා අම්මම්මා ඒක සතුටින් බාර ගත්තා කියලා.



මාසයක් ගෙවිලා ගිහිල්ලා අම්මම්මා ගෙදර එන දවස
ආවා. මම අම්මම්මා එනකල් දොර ළග හිටගෙන
බලාගෙනයි හිටියේ. ටික වෙලාවකින් අපේ කාර් එකේ
හෝන් එක ගහන සද්දෙ මට ඇහුනා. මම දෝණී අක්කිට
කිව්වා. දෝණී අක්කි ගිහින් ගේට්ටුව ඇරියා. කාර් එක
ආවා. පළවෙනියට බැස්සෙ අම්මා. දෙවනියට තාත්තා.
ඊලගට ලොකු අක්කි. අන්තිමට එළියට ආවෙ හැරම්ටියක්.
ඊටත් පස්සෙයි අම්මම්මා එළියට ආවෙ. මම දුවලා ගිහින්
අම්මම්මව බදා ගත්තා.



අපි හැමෝම කතා කර කර ගේ ඇතුලට ගියා. අම්මම්මට දැන් හොඳටම හොඳ වෙලා. දැන් නෑදෑයෝ ගොඩක් අම්මම්මව බලන්න එනවා. මේ ලෝකෙ මම විඳපු ලොකුම සතුට තමයි අම්මම්මා ගෙදර ආපු එක. දැන් ගෙදර හැමෝම ඉන්නෙ බොහෝම සතුටින් .
















ඔයා තමයි මේ ලෝකේ ඉන්න හොඳම අම්මම්මා

## අම්මම්මා මම ඔයාට ගොඩක් ආදරෙයි....











## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

මිල රුඃ 250/-